**අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරි වර්ෂයේ දේපල බදු දීම වෙනුවෙන් දරන ලද රු. 76,245 ක් වූ වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | වැරදීමකින් ගිණුම්ගත කර ඇති අතර, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05 කට අදාළ එකතුව රු. 26,205,751 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුවෙහි රු. 4,579,027 ක් වූ අසමානතාවයක් පැවතුණි. | ගිණුමේ දැක්වෙන ශේෂ වලට අදාල උපයෝගී ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ලේඛන යාවත්කාලීන කිරීමේ දුර්වලතා හේතු වී ඇති බව සහ එම දුර්වලතා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතුව රු. 118,959,055 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට හා උපලේඛන නිවැරදිව සකස් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 164 රීතිය | සභාවේ ගිණුම් ලියකියවිලි දිනපතා පරීක්ෂා කර තහවුරු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | රීති ප්‍රකාරව ඉදිරියේදී ලියකියවිලි නියමිත පරිදි පරීක්ෂා කර කෙටි අත්සන් තැබීමට කටයුතු කරන බවත්, දැනටමත් බලය පැවරූ නිලධාරියකු විසින් ලියවිලි පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මු . රෙ 134(3) | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ එක් වාර්තාවක් විගණනය වෙත යොමු කර ඇති අතර, 2020 වර්ෂයේ පළමු කාර්තුවේ වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මු . රෙ 395(ඈ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 04 කට අදාල 2019 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී බැංකු සැසඳුම් සැකසීමට කටයුතු කරමි. |
| iii. | මු . රෙ 571 | වසර දෙක ඉක්ම වූ වටිනාකම රු. 2,055,904 ක තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| iv. | මු . රෙ 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ගිවිසුම්වල පිටපත් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පාපාකො/ 2010/ 01 දරණ චක්‍රලේඛයේ 06 ඡේදය | සභාව සතු කඩ කාමර 14 ක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර තක්සේරු කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්, එම තක්සේරු වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම,රු. 6,918,275 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,046,597 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාවේ ජංගම ගිණුමකට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මුදල් පොතේ ශේෂය රු. 1,876,216 ක් වුවත්, ශේෂ පත්‍රයේ රු. 1,888,216 ක් ලෙස දක්වා තිබූ බැවින් රු. 12,000 ක වෙනසක් විය. | නිවැරදිව මූල්‍ය පාලනය සිදු කළ යුතුවේ. | මෙම වෙනස 2014 වර්ෂයේ සැප්තැම්බර් මස ආරම්භක ශේෂය ඉදිරියට ගෙන ඒමේදී සිදු වූ දෝෂයක් බැවින් එම වෙනස සමාලෝචිත වර්ෂය දක්වාම පැවතී ඇති අතර 2020 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී එය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස් කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 715,000 | 688,730 | 688,730 | 154,256 | 485,000 | 614,030 | 583,960 | 168,266 |
| කුලී | 14,094,474 | 12,277,855 | 11,363,236 | 1,373,182 | 12,488,800 | 12,082,712 | 11,915,273 | 715,195 |
| බලපත්‍ර ගාස්තු | 1,427,300 | 1,833,565 | 1,820,061 | 56,404 | 1,075,300 | 1,282,652 | 1,280,652 | 45,000 |
| වෙනත් ආදායම් | 6,812,544 | 11,696.267 | 3,808,065 | 13,673,080 | 4,829,800 | 5,149,232 | 1,611,043 | 6,634,930 |
| එකතුව | 23,049,318 | 26,496,418 | 17,680,092 | 15,256,922 | 18,878,900 | 19,128,626 | 15,390,932 | 7,563,391 |

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ සඳහා වරිපනම් බදු තක්සේරු කර අය කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව වරිපනම් බදු තක්සේරු කර අයකිරීමට කටයුතු කළ යුතුවේ. | දියුණු කළ ප්‍රදේශයන්හි තොරතුරු තක්සේරු කටයුතු සඳහා එම ආයතනයට යවා ඇති බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ව්‍යාපාර ඒකක 21 කින් අයවිය යුතු ව්‍යාපාර බදු රු. 152,370 ක් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම හිඟය 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අදාළ මුදලක් බවත්, එම ස්ථාන මේ වන විට නොපවතින බවත්, මුදල් අයකර ගැනීමට පුද්ගලයන්ද සොයාගත නොහැකි නිසා අදාළ මුදල කපා හැරීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 1,631,271 ක් හා රු. 11,884,148 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුද්දර ගාස්තු රු. 3,900,000 ක් ලැබී ඇති අතර, ඉතිරි හිඟ මුදල හා උසාවි දඩ මුදල් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කාරණා 28 ක් සඳහා ප්‍රමාණවත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා 29 ක් වැළඳගෙන ඇති බව දන්වමි. |

### (ආ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් රු.830,000 ක ප්‍රතිපාදන සලස්වා තිබූ ඉදිරි සංවර්ධන යෝජනා 11 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.<br>. | අයවැය ලේඛනයේ ඇතුළත් සංවර්ධන යෝජනා වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතුවේ. | අයවැය ලේඛනයේ ඇතුළත් සියළු කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට ආදායම් නොලැබීම නිසා කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර, ඉදිරියේදී සහා ආදායම් හා වියදම් සලකා බලා ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති සංවර්ධන යෝජනා පමණක් එම ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

### (ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | 2019 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි තිරසර සංවර්ධන අරමුණු වල ප්‍රගතිය ඉදිරිපත් කර ඇති අතර, ඉදිරි සිවු අවුරුදු සැලැස්මෙහි එම අභිමතාර්ථ ඉටු කර ගැනීම පිළිබඳව කටයුතු ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් ආයතන 58 ක් පැවති අතර ඒ අනුව බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන විවිධ ආයතන මගින් පරිසරයට වන හානිය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුවේ. | විවිධ කරුණු හේතුවෙන් ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු සියළුම ව්‍යාපාර වෙත සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි වූ අතර, සියලු උත්සාහයන් දරමින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගෙන නොමැති ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා දීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### 3.3.1 සේවක පුරප්පාඩු හා අතිරික්තතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 04 ක් පිරවීමට සහ අතිරික්තතා 10 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සේවක සංඛ්‍යාවෙන් එක් පුරප්පාඩුවක් පමණක් සම්පූර්ණ කරගෙන ඇති අතර, ඉතිරි පුරප්පාඩු ඉදිරියේදී සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් සහ මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල ගිවිසුම් හා සැලසුම් පිළියෙල කිරිමට කටයුතු කළ යුතුවේ. | මානව සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳ දැනුවත් වී නොසිටි අතර, 2020 වර්ෂයේ සැකසීමට කටයුතු කරන අතර, වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.4 වත්කම්කළමනාකරණය

### 3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු අක්කර 03 ක් වූ ඉඩම් 02 ක් පෞද්ගලික පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් පැවතුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වේ. | ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් භාවිතයට ගනු ලබන වටිනාකම රු. 7,826,130 ක් වූ ඉඩම් 20 ක්, වටිනාකම තක්සේරු නොකර භුක්ති විඳින ඉඩම් 25 ක්, වටිනාකම රු. 1,935,000 ක් වූ ගොඩනැගිලි 12 ක් සහ වටිනාකම රු. 9,309,900 ක් වූ වාහන 03 ක් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැඟිලි පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර, අයිතිය සනාථ කළ හැකි ඉඩම්වල වටිනාකම තක්සේරු කර පවරා ගැනීමටත්, එක් වාහනයක් ලීසිං ක්‍රමයට ලබා ගෙන ඇති අතර, තවත් වාහනයක් ගිවිසුම්ගත වීමකින් ලබා ගෙන ඇති බවත්, ඉතිරි වාහනය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

### 3.4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ඉඩම් 17 ක් ඵලදායී කාර්යයකට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාව සතු ඉඩම් බොහොමයක් ක්‍රීඩා පිටි සහ සුසාන භූමි සඳහා භාවිතා කරන අතර, ඇතැම් ඉඩම්වල වගා කටයුතු කරන බවත්, පිලිසරු භූමියේ අක්කර 05 ක වගාවක්ද මේ වන විට සිදු කර ඇති බව දන්වමි. |

### 3.5 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව සභාව සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද සභාවට ඉදිරිපත් කර අනුමත කර ගැනීම පිළිබඳව දැනුවත් වී නොසිටි බවත්, 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වමි. |